# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2255/7 – 2021 නොවැම්බර් 23 වැනි අඟහරුවාදා – 2021.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ගාල්ල මහ නගර සභාව සහ අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන මහ ගාල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මාහට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2020 සැප්තැම්බර් මස 24 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, ගාල්ල මහ නගර සභාව සහ අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන මහ ගාල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ (පා.ම.),**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2021 සැප්තැම්බර් මස 28 වැනි දින.
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
'සුහුරුපාය',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

1A – G 35408 – 50 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ගාල්ල මහ නගර සභාව, අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින්, බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන මහ ගාල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද ගාල්ල මහ නගර සභාව, අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින්, බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන මහ ගාල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම, 2021 ක් වූ සැප්තැම්බර් මස 28 දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**මහින්ද රාජපක්ෂ (පා.ම.),**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2021 නොවැම්බර් මස 22 වැනි දින.
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
'සුහුරුපාය',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

---

**ගාල්ල මහ නගර සභාව, අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින්, බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන මහ ගාල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තියේ බලතල ප්‍රකාරව ගාල්ල මහ නගර සභාව, අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින්, බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන, මහ ගාල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 සැප්තැම්බර් මස 28 වැනි දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**මේජර් ජනරාල් (විශ්‍රාමික) උදය නානායක්කාර,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2021 නොවැම්බර් මස 22 වැනි දින.

12 - 38

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.